**කන්තලේ ප්‍රාදේශීය සභාව - 2021**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

කන්තලේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කන්තලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාළව සමාලෝචිත වර්ෂයේ ලද මුද්දර ගාස්තු රු.2,893,351 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කර තිබුණි. | 2022 අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත්කරුවකු වෙත ගෙවා තිබූ රු.913,000 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රය තුළ හෙළිදරව් කර නොතිබුණි. | | |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති. රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.28,792,365 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මින් රු.10,738,556 ක් වර්ෂ 10 පමණ සිට අය වීමට තිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | | |
| | (i) 33 වැනි රීතිය | රු.11,659,457 ක් වූ වරිපනම් බදු පැහැර හරින ලද පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් නඩත්තු කර නොතිබුණි. | ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරමි. | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 218 වැනි රීතිය | පිරිවැය රු.160,890,599 ක් වූ සියලුම ඉඩම් හා ගොඩනැගිලි වර්ෂ 05 කට වඩා කාලයක සිට වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබුණි. | ඉදිරියේදී සමීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ. | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර 2 ක් ඉක්මවූ රු.1,384,887 ක රැඳවුම් තැන්පතු ශේෂ 2 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2021/09/29 දිනැති අංක PFD/PMD/Cir/2021/01 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ . | ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පිරිනැමීමේදී ආයතන ප්‍රධානියා සහ ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් සුදුසුකම් සනාථ කිරීමෙන් තොරව අවස්ථා 05 කදී රු. 7,137,038 ක් වටිනා කොන්ත්‍රාත් 05 ක් පිරිනමා තිබුණි. | ප්‍රජා සංවර්ධන නිලධාරිගේ නිර්දේශය මත අදාළ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සිදු කර ඇත. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,574,147 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,765,379 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු**<br>සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.11,659,457 ක වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර සභාවේ ආදායම් අංශයේ ආකාර්යක්ෂමතාවය මීට සෘජුව බලපා තිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **කුලී**<br>සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික කුලිය රු.2,452,132 ක් වූ කඩකාමර බදුදීමට අදාළ බදු ගැනුම්කරුවන් 32 ක් සමඟ විධිමත් ලෙස ගිවිසුම්ගත වී නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඔවුන්ගෙන් අයවිය යුතු රු.4,377,705 ක හිඟ කුලී අයකිරීමටද කටයුතු කර නොතිබුණි. | | |

(ඇ) බලපත්‍ර ගාස්තු

-----------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2000 අංක 53 හා 1998 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනතට අනුව සමාලෝචිත වර්ෂය තුළ පරිසර බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත 129 කින් බලපත්‍ර ලබාගෙන තිබුණේ කර්මාන්ත 45 ක් වීම හේතුවෙන් බලපත්‍ර ගාස්තු සහ පරීක්ෂණ ගාස්තු ලෙස සභාවට අයකර ගත හැකිව තිබූ රු.588,000 ක් අහිමිව තිබූ අතර පරිසර බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත 84 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි. | ඉදිරියේදී පාරිසරික බලපත්‍ර ලබා ගන්නා ලෙස පාරිභෝගිකයින් දැනුවත් කිරීමට සැලසුම් සකස් කර ඇත. | පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත කාලීනව හඳුනාගෙන පනත අනුව සිදු කළයුතු නියාමනයන් කළයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 නිශ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී මිලට ගත් රු.295,500 ක් වටිනා බුලේ සෙට් 09 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිශ්කාර්යව පවතින බව තහවුරු විය. | අදාල මන්ත්‍රීවරුන්ගේ ප්‍රමාදය මෙයට හේතුවිය. | මිලදී ගත් භාණ්ඩ ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂ 05 කට වඩා කාලයක සිට පැවත එන තනතුරු 03 ක නිලධාරීන් 04 කගේ පුරප්පාඩු හේතුවෙන් විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීම, මහජන පැමිණිලි සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගැනීම, වාහන සම්බන්ධ විධිමත් ලේඛන හා ධාවන සටහන් පවත්වාගෙන යාම ආදි සභාව විසින් මහජන සුබසාධනය සඳහා ගත යුතු ක්‍රියාමාර්ග රාශියක් ගෙන නොතිබුණි. | අදාළ බඳවා ගැනීමේ බලධාරියා මෙතෙක් බඳවා ගැනීම් සිදු කර නොමැත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ වාහන ආයතන පරිශ්‍රයෙන් පිටතට ගමන් කිරීමේදී හා බැහැර සිට නැවත ආයතනයට පැමිණීමේදී අදාළ වාහන ගමන් කරන ස්ථානය, ගමනේ විෂයය, මයිලෝමීටරය, කා සමඟද ගමන් කරන්නේ ආදී විස්තර පිළිබඳ ගේට්ටු වාර්තා නඩත්තු කර නොතිබුණි. | ඉදිරියට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වාහන ඵලදායීව උපයෝජනය කළ යුතු අතර වාහන පාලනයට අදාළ ලියවිලි සහ උපලේඛන පවත්වාගෙන යා යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වැය විෂයයන් 20 ක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදන රු.74,198,615 ක් ඉතිරි වී තිබුණු අතර එය ඇස්තමේන්තු ප්‍රතිපාදන වටිනාකමින් සියයට 50 සිට සියයට 98 දක්වා පරාසයක විය. එමෙන්ම තවත් වැය විෂයයන් 19 ක සම්පූර්ණ ප්‍රතිපාදන රු. 12,475,250 ක් ඉතිරි වී තිබුණි. | පැවති වසංගත තත්ත්වය හමුවේ අපේක්ෂිත ප්‍රතිපාදන සම්පූර්ණයෙන් වියදම් කිරීමට නොහැකි වූ බව දන්වමි. | වාර්ෂික අයවැය විධිමත් පාලන උපකරණයක් ලෙස භාවිතා කළ යුතුය. |